**e - ඥාන පියස වැඩසටහන**
**දියමන්ති ව්‍යාපෘතිය**
**සමාන්‍ය පාඩම් - 11 පාඩම**

| විෂය | ශ්‍රේණිය | වාරය | පාඩම/ඒකකය |
|---|---|---|---|
| චිත්‍ර කලාව | 10 | III | 6.1.6. පෙරියතම්බි සුබ්‍රමණියම් ශිල්පියාගේ නිර්මාණ අගයමු |

- දෙමළ ජනතාවගේ එදිනෙදා ජීවිත අවශ්‍යතාවන් සමග බැඳි අභිලාෂයන් ඉටු කළ චිත්‍ර ශිල්පියකු ලෙස පෙරියතම්බි සුබ්‍රමණියම් චිත්‍ර ශිල්පියාගේ නිර්මාණවලට සුවිශේෂී ස්ථානයක් හිමි වේ.
- ඉන්දියානු කලාකරු රවි වර්මාගේ පුරාණ ඓතිහාසික සිද්ධි නිරූපිත සිතුවම්වල ශෛලිය ලක්ෂණ පෙ. සුබ්‍රමණියම්ගේ සිතුවම් සඳහා ද ආභාස වී ඇත.
- රවි වර්මාගේ සිතුවම්වල ශෛලිය සඳහා ඉන්දීය ජනප්‍රිය සංස්කෘතියේ ප්‍රකාශිත මාධ්‍ය වන චිත්‍රපට, කැලැන්ඩර් හා පෝස්ටර් චිත්‍ර ආදිය තුළින් නිරූපිත දේව රූප ලක්ෂණ පෙන්වන අතර එකී ලක්ෂණ පෙ. සුබ්‍රමණියම් ශිල්පියාගේ සිතුවම් ආශ්‍රිතව හඳුනාගත හැකි ය.
- ඔහුගේ සිතුවම් පහත සඳහන් කොවිල්වල බිත්ති මත හා තිර රෙදිවල දක්නට ලැබේ (නල්ලූර් කෛලාසපිල්ලෙයාර් කෝවිල ඉනුවිල් පරරාසසේකර පිල්ලෙයාර් කෝවිල සුදුමලයි අම්මන් කෝවිල වැල්වෙට්ටිත්තුරෙයි සිවන් කෝවිල නල්ලූර් වීර කාලි අම්මන් කෝවිල වේලණෛයි අම්මන් කෝවිල)
- ඔහුගේ සිතුවම් ලෙස **අගස්තියර් හා විනායගර්** නම් සිතුවම හා **ඇතා වල්ලිව එළවාගෙන යාම** ගත හැක.

**<u>ක්‍රියාකාරකම</u>**

1) පෙරියතම්බි සුබ්‍රමණියම් ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

2) පෙරියතම්බි සුබ්‍රමණියම්ගේ නිර්මාණවල සුවිශේෂී ලක්ෂණ නම් කරන්න.

3) පහත දී ඇති සිතුවම හඳුනාගනිමින් කෙටි හැඳින්වීමක් කරන්න

•හඳුනාගත් බව : ................................

•ශිල්පියා : ...................

•ශිල්ප ක්‍රමය : ...................

•වර්ණ භාවිතය : ...................

•ශිල්පීය කුසලතා: ...................



**<u>ඇගයීම</u>**

1) පෙරියතම්බි සුබ්‍රමණියම් ශිල්පියාගේ නිර්මාණ, තොරතුරු හා ඡායාරූප එක්රැස් කරන්න

2) ඔහුගේ ප්‍රසිද්ධ නිර්මාණ හා ඒවා හමුවන ස්ථාන නම් කරන්න.

3) ඔහුගේ නිර්මාණ සඳහා බලපෑ කලා ආභාසය පිළිබද විස්තර කරන්න

4) පෙරියතම්බි සුබ්‍රමණියම් ශිල්පියාගේ ප්‍රධාන සිතුවම් 2ක් ගෙන හඳුනාගත් බව, ශිල්ප ක්‍රමය, වර්ණ භාවිතය හා ශිල්පීය කුසලතා යන උප මාතෘකා ඔස්සේ කෙටි හැඳින්වීමක් කරන්න